ආගන්තුක පරිසරයට අනුගත වෙන්න බැරිව වල්මත් වෙලා හිස හැරුණු අතේ යනවා

අලුත් තැනකට දාපු හින්ද මිනිස්සු එක්ක වෛර බඳිනවා

දාපු තැන ඉන්නෙ නැතිව හිටපු තැනටම එන්න හදනවා

අලියි-මිනිස්සුයි දෙගොල්ලොම ප්‍රශ්නෙන් ගලවා ගන්න ඕනෑ

අලි පරිස්ථාපනය ගැන අලුතෙන් හිතමු



ශ්‍රී ට වසර කිහිපයකට ඉහත සියඹලාන්ගමුවේ දළ ඇතා ලෙස ප්‍රකටව සිටි හස්තියා උගේ පාරම්පරික වාසභූමියෙන් පිටමං කර පරිස්ථාපනය කරමින් සිටියදී මරණයට පත් වීමට ඇඳුණු සිදුවීම සම්බන්ධයෙන් පසුගිය සති දෙකපුරා "මව්බිම" පුවත්පතේ පළවූ විශේෂාංග ලිපිය බොහෝ දෙනාගේ අවධානයට ලක් වන්නට ඇතැයි සිතමි. එම මරණය සිදුවී වසර ගණනක් ගෙවී ගොස් තිබියදී පවා අපි තවමත් සියඹලාන්ගමුවේ හස්තියාගේ වියෝව පිළිබඳව ශෝක වන්නෙමු. ශ්‍රී ලංකාවේ අපට සොබාදහමෙන් හිමිව තිබූ අමිල දායාදයක් ඒ ආකාරයෙන් වැනසී යෑම සැබැවින්ම කනගාටුවට කරුණකි. එසේම මින් ඉදිරියට හෝ එවැනි අවාසනාවන්ත සිදුවීම් ඇතිවීම වළක්වා ගැනීම සඳහා ඉතිහාසයෙන් පාඩම් උගැනීමද ඉතා වැදගත්ය.

විශේෂයෙන් මිනිස් ජීවිත හා දේපොළවලට තර්ජන එල්ල කරන බවට චෝදනා ලබන අලි ඇතුන් මේ ආකාරයෙන් තමන් වෙසෙන වාස භූමිවලින් නිර්වින්දනය කර අල්ලා බැඳ දමා ලොරියක් වැනි ප්‍රවාහන මාධ්‍යයක් උපයෝගී කරගනිමින් එම සතුන්ගේ පාරම්පරික වාසභූමියෙන් ඉවත් කර වඩාත් දුරබැහැර ආගන්තුක පරිසරයක පිහිටි වනජීවී රක්ෂිතයකට පිටමං කිරීම හැඳින්වෙන්නේ පරිස්ථාපනය (Translocate) නමිනි. මෙසේ පරිස්ථාපනය කරනු ලබන අලි ඇතුන්ගේ ඉරණම මෙරට වන අලි කළමනාකරණයේ අරමුණු ඉටු කරන ක්‍රියාවලියක්ද යන්න විමසා බැලීම කාලීන අවශ්‍යතාවකි.

මේ ක්‍රියාවලිය අධ්‍යයනය කිරීමේදී වන අලියා නිසි පරිදි හඳුනාගැනීම, නිර්වින්දය කර අල්වා ගැනීම, එම සත්ත්වයා ප්‍රවාහනය කරන තුරු රඳවා තබා ගැනීම, ලොරියකට පටවා ගැනීම, ප්‍රවාහනය කිරීම, ආගන්තුක පරිසරයට හඳුන්වා දීම හා එම ආගන්තුක පරිසරයට එම සත්ත්වයා දක්වන ප්‍රතිචාර හෝ හැඩගැසීම ආදිය පිළිබඳ විමසා බැලිය යුතුය. පසුගිය කාල සීමාව පුරාවටම මේ ආකාරයෙන් පරිස්ථාපනයට ලක් කරන ලද අලි ඇතුන් 20ක් පමණ චන්ද්‍රිකා තාක්ෂණ කරපටි පැලැඳවීම මඟින් අධ්‍යයනය කිරීමට දෙස් විදෙස් ප්‍රකට වනජීවී විද්වතකු වන ආචාර්ය පෘථිවිරාජ් ප්‍රනාන්දු මහතා (සංරක්ෂණ පර්යේෂණ ආයතනය) සහ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් කටයුතු කරනු ලැබූහ. එම දත්ත මත පදනම්ව මේ පරිස්ථාපන ක්‍රියාවලියේ සාර්ථක අසාර්ථක බව කදිමට වටහාගත හැකි වුවද එය මේ දක්වාම නිසි පරිදි සිදු නොවීම කනගාටුවට කරුණකි.

මේ ආකාරයෙන් පරිස්ථාපනය අධ්‍යයනය කරනු ලැබූ අලින්ගෙන් මේ වන විට ජීවතුන් අතර සිටින අලි සියලු දෙනාම දිවි ගෙවන්නේ එම සතුන් මුදා හරිනු ලැබූ වනජීවී රක්ෂිතවලින් බැහැරව වීමද විශේෂ කරුණකි. අලි දෙදෙනකු පමණක් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් ප්‍රදේශ වෙත සංක්‍රමණය වී දන්නා තරමින් ගැටුම් ඇති කර නොගෙන දිවි ගෙවීමට පුරුදුව ඇතත් මේ සතුන් දෙදෙනා තම පාරම්පරික වාසභූමිවලදී ද ගැටුම් ඇතිකරගත් සතුන් ද යන්න මතභේදාත්මකය. අනෙක් සතුන් අතිමහත් බහුතරයක් යළිත් තමන්ගේ නිජබිමට සංක්‍රමණය වීමට හෝ ආගන්තුක පරිසරයේදී යළිත් මිනිස් ජීවිත හා දේපොළවලට තර්ජන එල්ල කිරීමට හෝ පෙළඹීම, මේ වන අලි කළමනාකරණ උපාය මාර්ගය ගැන දෙවරක් සිතන්නට සංරක්ෂණවේදීන්ට මඟපාදන බව අපගේ විශ්වාසයයි.

මෙසේ පීඩාකාරී වන අලි ලෙස හඳුන්වනු ලබන අලි ඇතුන් නියමාකාරයෙන් හඳුනාගත් පසු එම සත්ත්වයන් පරිස්ථාපනය සඳහා නිර්වින්දනය කර බැඳ දැමීම සිදු කෙරෙයි. මෙසේ වන අලි ඇතුන් වනාන්තර තුළ දී නිර්වින්දනය කිරීම එම සත්ත්වයාගේ ජීවිතය අවදානමකට ලක් කිරීමකි. මිනිසුන් වන අප ශල්‍යාගාරයක් තුළදී යම් ශල්‍යකර්මයක් සිදු කිරීමට පෙර දහසකුත් එකක් පරීක්ෂණවලට භාජන කරනු ලබන බව අපි දනිමු. එහි අරමුණ අප නිර්වින්දනය කිරීම සඳහා හොඳ සෞඛ්‍ය තත්ත්වයේ පසු වන්නේද, නිර්වින්දනයෙන් පසු යළිත් ප්‍රකෘති සිහියට පත් කළ හැකි වේද, අවශ්‍ය වන නිර්වින්දන ඖෂධ මාත්‍රාව කොපමණ ද යනාදිය දැනගැනීමය. එවැනි පරීක්ෂාවක් සිදු නොකර වනාන්තරය තුළදී අලි ඇතුන් නිර්වින්දනය කිරීමම එම සත්ත්වයාගේ ජීවිතය තර්ජනයට ලක් කිරීමකි. තවද එම හස්තියා නිර්වින්දනය වී වැරැදි ස්ථානයක වැරැදි ඉරියව්වකින් ඇද වැටීමද මරණයෙන් කෙළවර විය හැකි තත්ත්වයකි. හස්තියකු නිර්වින්දනය වී දිව ගොස් බිම පතිත වීමේදී උගේ හොඬය සිරුරට යට වීමට හෝ ඉදිරි පාද පෙණහලු මත තෙරපී ඇද වැටීමෙන් මරණය ගෙන දෙයි. එසේම විශාල ගස් දෙකක් අතරට හිර වී ඇද වැටීම හෝ ජලාශයක ඇද වැටීමද ඒ ආකාරයය. යම් ජීවියකු නිර්වින්දනය කිරීම සඳහා ඖෂධ මාත්‍රාව නිර්ණය කරනු ලබන්නේ එම ජීවියාගේ බර අනුවය. වනාන්තරයේදී වන අලියකුගේ බර කිරීම හිතළුවක් පමණක් බැවින් පශු වෛද්‍යවරුන් සිදු කරන්නේ එම සත්ත්වයාගේ බර අනුමාන කිරීමය. එම අනුමානය අනුව තීරණය කරන නිර්වින්දන ඖෂධ මාත්‍රාව අඩු වුවහොත් හස්තියා නිර්වින්දනය නොවන අතර මාත්‍රාව නියමිත ප්‍රමාණයට වඩා වැඩි වීම එම සත්ත්වයා සදාතනික නින්දකට පත් කරන බව කිවමනාය. මෙසේ වන අලි නිර්වින්දනය කිරීමට අවශ්‍ය මාත්‍රාව තීරණය කිරීමේ නිරවද්‍යතාව වනජීවී පශු වෛද්‍යවරයාගේ පළපුරුද්ද මත රඳා පවතී.

වරක් අනුරාධපුර වඩාකඩ රජයේ රක්ෂිත ප්‍රදේශයේදී පරිස්ථාපනය කිරීම සඳහා බැඳ දැමූ වන අලියකු කුමන හෝ අවාසනාවක් නිසා මරණයට පත් විය. එම සද්දන්තයාගේ පශ්චාත් මරණ පරීක්ෂණය පැවැත්වූ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පශු වෛද්‍යවරුන් ප්‍රකාශ කළේ මරණයට හේතුව මේ සත්ත්වයා නිර්වින්දනය කිරීමට ප්‍රථම යම් කිසි පුද්ගලයකු විසින් තබන ලද වෙඩි ප්‍රහාරයක් බවයි.

අලි ඇතුන් නිර්වින්දනය සම්බන්ධ ඉහත තොරතුරු පිළිබඳ වැටහීමක් රේඛීය අමාත්‍යාංශයේ දේශපාලන අධිකාරියට තිබුණේ නම් එම මරණය විමතියට කරුණක් ද නොවේ. අලි ඇතුන් නිර්වින්දනය කිරීමට පෙර උගේ සෞඛ්‍ය තත්ත්වය පිළිබඳ අවබෝධය ලබාගත හැකි ක්‍රමයක් භාවිත නොකෙරෙන බව අපි ඉහත සඳහන් කළෙමු. එබැවින් වරද ඇත්තේ වනජීවී නිලධාරීන්ගේ හෝ වන අලියාගේ නොවේ. වන අලියා පරිස්ථාපනයට තීරණය කිරීම තුළය. ඉනික්බිති මෙසේ අල්ලා ගන්නා වන අලි ප්‍රවාහනය කිරීම සඳහා බැඳ දමා සිටින විට විශේෂයෙන් රාත්‍රී කාලයේදී වෙනත් වන අලින්ගෙන් අඩන්තේට්ටම්වලට ලක්වූ අවස්ථා කලින් කලට වාර්තා වී ඇත. තවද මෙසේ අල්ලාගත් අලි ඇතුන් පරිස්ථාපනය කිරීමේදී සියඹලාන්ගමුවේ ඇත් රජු මෙන්ම අනතුරට ලක්ව මරණයට පත් වීමට ඉඩ කඩ තිබේ. ඒ මතුද නොව ආගන්තුක පරිසරයට මුදාහරිනු ලැබූ පසුව ද එයට යහපත් පරිදි අනුගත වීමට නොහැකිව අලි ඇතුන්ගේ ජීවිත අභියෝගයට ලක්වේ. කෙදිනක හෝ නොදුටු ආගන්තුක පරිසරයකට මුදා හරිනු ලැබ එහි අතරමං වන අලි ඇතුන් තව තවත් මිනිසුන් කෙරෙහි වෛර බැඳ ගැනීම හා මිනිසුන්ගේ වගාබිම්වලට ආකර්ෂණය වීම විමතියට කරුණක් ද නොවේ. තවද මෙහි අවාසනාවන්තම ප්‍රතිඵලය නම් මෙසේ පරිස්ථාපනය කරන වන අලින්ගෙන් සියයට තිහකට වඩා මාස කීපයක් තුළ මරණයට පත් වීමයි.

තවද මෙසේ පරිස්ථාපන කෙරෙන ඇතැම් වන අලි ආගන්තුක පරිසරයට හරි හැටි අනුගත වීමට නොහැකිව වල්මත්ව හිස හැරුණු අත ඇවිද යෑම ද මේ පරිස්ථාපන ක්‍රියාවලියේම තවත් කොටසකි. මෙවැනි අලින් කිහිප දෙනකු බුත්තල-මොනරාගල හා දෙහිඅත්තකණ්ඩිය වැනි නගර වෙත පැමිණ කලබල ඇති කර මිනිස් දේපළ හා ජීවිතවලට තර්ජන එල්ල කළ අවස්ථා හඳුනාගෙන ඇත. අලි ඇතුන් පරිස්ථාපනයට පෙර චන්ද්‍රිකා තාක්ෂණ කරපටි පැළඳවිය යුතුය යන ප්‍රතිපත්තිමය තීරණය ද බිඳ දමමින් හම්බන්තොට ප්‍රදේශයේ සිට මාදුරුඔය ජාතික වනෝද්‍යානයට ගෙන ගොස් මුදාහරින ලද එක් වන අලියකු වරක් දෙහිඅත්තකණ්ඩිය නගරයට පැමිණ මහත් කලබලයක් ඇති කිරීම මීට එක් උදාහරණයක් ලෙස හඳුනාගත හැකිය. මේ ආකාරයෙන් පෙරළා වාර ගණනාවකදී පරිස්ථාපනයට බඳුන් කළ ද තම නිජබිම සොයා පැමිණි අලි ඇතුන් ද හඳුනාගත හැකිවීම අලි ඇතුන් තම පාරම්පරික වාසභූමි කෙරෙහි දක්වන ආදරය මොනවට පෙන්වා දෙන අතරම අපගේ වන සත්ත්ව කළමනාකරණයේ අමානුෂික බව හා එය යථාර්ථයෙන් කොතරම් බැහැර ද යන්න ද අවධාරණය කරනු ඇති බව අපගේ විශ්වාසයයි.

රටක් ලෙස ශ්‍රී ලංකාවේ සමාජ, ආර්ථික පරාමිතීන්ට ප්‍රබල බලපෑමක් එල්ල කරන අලි - මිනිස් ගැටුමට අප වඩාත් යුහුසුලුව ප්‍රතික්‍රියා කළ යුත්තේ අප අලි ඇතුනුත් මනුසතුනුත් යන දෙපිරිසම මේ උවදුරෙන් මුදාගත යුතු බැවිනි.

සිරිලක අලි ඇත් පරපුරේ අනාගතය ශෝකාන්තයක් බවට පත් කරන පැලැස්තර විසඳුම් විනා සිරිලක වන අලි පරපුරේ ඛේදවාචකයට ස්ථිරසාර හා දීර්ඝකාලීන විසඳුමක් ලබා දෙනු පිණිස අදාළ වගකිවයුත්තන් ක්‍රියා නොකිරීමේ අවාසනාවන්ත ප්‍රතිඵලයක් ලෙස සිරිලක වන අලි ගහනයේ විසූ විශාලතම දළ ඇතා ලෙස සලකනු ලැබූ සියඹලාන්ගමුවේ ඇත් රජු මරණයට පත්වීමත් සමඟ ද අලි ඇතුන් පරිස්ථාපනය කිරීම නම් වන අසාර්ථක වන අලි කළමනාකරණ ක්‍රමවේදයට තිත තැබීම උදෙසා ප්‍රබල ජනමතයක් ඇති කිරීමට එම අවාසනාවන්ත සිදුවීම හේතු විය. නමුත් එම ප්‍රවේශය මඟින් යහපත් කතිකාවතක් ඇති කර එහි වැදගත් කරුණු උකහා ගැනීමට අදාළ බලධාරීන් උත්සාහ දැරූ බවක් පෙනෙන්නට නැත.

අලි ඇතුන්ගේ වාසභූමි උදුරාගෙන හිසරදයට කොට්ටය මාරු කරන්නා සේ අලි ඇතුන් එහා මෙහා ගෙන ගොස් කරකවා අතහැරීම තවදුරටත් යථාර්ථවාදී විසඳුමක් නොවන බව පැහැදිලිය. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මේ ආකාරයෙන් කණාමුට්ටි ගැසීමේ අවසන් ප්‍රතිඵලය තවදුරටත් මෙරට අලි ඇතුන් මෙන්ම මනු සතුන්ද කබලෙන් ලිපට වැටීමය.

දඩබ්බර අලි ඇතුන් කළමනාකරණය යන "ගිනි නිවීම" වෙනුවට ඔවුන් බිහි කරන ක්‍රමයට තිත තබා "ගිනි වළකා ගැනීමේ" මඟට අවතීර්ණ වීම සිදු විය යුතුව ඇත. මේ සම්බන්ධයෙන් ප්‍රායෝගික හා සඵලදායක විසඳුමක් හමස් පෙට්ටියෙන් පිටතට ගත යුතු කාලය අපි දැනුදු ගෙවා දමමින් සිටින්නෙමු. අලි ඇතුන් යනු ශක්තිමත්, බුද්ධිමත් හා සංවේදී සත්ත්ව විශේෂයක් බව වටහාගෙන අලි ඇතුන් සංරක්ෂණය හා සංවර්ධනය මනා ලෙස ගැළපීමට ප්‍රතිපත්ති සම්පාදකයන් ද උත්සාහ දැරිය යුතුය. එසේම මේ ගැටුමට වගකිවයුතු සියලු පාර්ශ්ව තම වගකීම නිසි පරිදි වටහාගෙන ඒ අනුව ක්‍රියාත්මක විය යුතුය. තම ප්‍රදේශයේ ගම්වැසියකු මරණයට පත් වූ විට කුපිත වන ජනතාව ප්‍රකෝපකාරී ලෙස හැසිරෙති. එයින් බොර දියේ මාළු බාන දේශපාලකයෝ ඉතා අවස්ථාවාදී ලෙස වනජීවිතයට, වන අලින් පරිස්ථාපනය කිරීමට හෝ එළවා දැමීමට හෝ බල කරති. එවිට වනජීවිය කළ යුත්තේ දේශපාලන අධිකාරියේ එහෙයියන් වීම නොව තම අතීත අත්දැකීම් හා දැනුම අවබෝධය සම්පිණ්ඩනය කොට වඩාත් යථාර්ථවාදී දීර්ඝකාලීන විසඳුම් ක්‍රියාවලියක් වෙත ප්‍රවේශ වීමය. එසේ නොකර සියලු වගකිව යුත්තෝ තම වගකීම පැහැර හරිමින් මුණිවත රැකීම සිරිලක අගනා සොබා උරුමයක් වන අලි ඇතුන් සම්පතට හිමි කර දෙන්නේ ශෝකාන්තයක් පමණි. එහි පාඩුව කෙදිනකවත් පිරිමසාලිය නොහැකි බව ඉතා අවධාරණයෙන් ලියා තබනු කැමැත්තෙමු.

■ සුපුන් ලහිරු ප්‍රකාශ

> අලි ඇතුන්ගේ වාසභූමි උදුරාගෙන හිසරදයට කොට්ටය මාරු කරන්නා සේ අලි ඇතුන් එහා මෙහා ගෙන ගොස් කරකවා අතහැරීම තවදුරටත් යථාර්ථවාදී විසඳුමක් නොවන බව පැහැදිලිය. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මේ ආකාරයෙන් කණාමුට්ටි ගැසීමේ අවසන් ප්‍රතිඵලය තවදුරටත් මෙරට අලි ඇතුන් මෙන්ම මනු සතුන්ද කබලෙන් ලිපට වැටීමය.

■ සංස්කරණය - හසිත කුරුප්පු
ruk.mawbima@gmail.com

අසාර්ථක වන අලි පරිස්ථාපනයන්ට නිදසුන්

අනුරාධපුර ප්‍රදේශයේ ජීවත් වූ අලංකාරවත් දළ ඇතෙකි. උඩවලව ජාතික වනෝද්‍යානයට පරිස්ථාපනය කළ පසු ආගන්තුක පරිසරයේ අතරමංව වල්මත් වූ මේ සතා වරෙක පොකුණුතැන්න ප්‍රදේශයේද, තවත් වරෙක බුත්තල නගරයේද කලබල ඇති කර මිනිස් ජීවිත හා දේපළවලට තර්ජන එල්ල කරන්නට විය. බුත්තල නගරයේදී එල්ල කළ පොලිස් වෙඩි පහරකින් තුවාල ලබා අසාධ්‍ය තත්ත්වයට පත් විය. ප්‍රතිකාර කර ලුණුගම්වෙහෙර උද්‍යානයට යළිත් පරිස්ථාපනය කෙරුණු අතර ලුණුගම්වෙහෙර ජාතික උද්‍යානය තුළදී කිසිවකු විසින් වෙඩි තබා ඝාතනය කරන ලදී.

නියං සමයේදී කලාවැව පිටියේත්, සෙසු කැලෑවල ගල්ගමුව ආශ්‍රිත වනාන්තර තුට්ටිවලත් දිවි ගෙවූ එක් දළයක් සහිත මේ හස්තියා කලහකාරී සතකු ලෙස හඳුන්වා සෝමාවතී ජාතික උද්‍යානයට පරිස්ථාපනය කරන ලද්දේ 2009 පෙබරවාරි 16 වැනිදාය. ගල්ගමුවට වඩා කිහිප ගුණයක් සශ්‍රීක හා විශාල අලි ඇතුන්ට හිතකර පරිසරයක් සෝමාවතියේ තිබියදී මේ තනි දළයා කිලෝමීටර් 243ක් ගෙවා ඉතා කෙටි කලකදී යළිත් තම පාරම්පරික වාසභූමියට පැමිණියේය.

නිකවැරටිය ප්‍රදේශයේ සැර්සැරූ හස්තියකු එහි බ්‍රිගේඩියර්වරයකුගේ නිවෙසකට අලාභහානි කිරීමේ ප්‍රතිඵලයක් ලෙස 2010 අප්‍රේල් 29 වැනිදා මාදුරුඔය ජාතික උද්‍යානයට පරිස්ථාපනය කරනු ලබන්නේ සැබැවින්ම මේ අලියා පීඩාකාරී කලහකාරී සතකු නිසාද, හුදෙක් බ්‍රිගේඩියර්වරයාගේ නිවෙසට පහරදීමට දඬුවම් ලෙසින්ද යන්න ගැටලුසහගතය. කෙසේ වෙතත් මේ සිදුවීමෙන් "බ්‍රිගේඩියර්" ලෙස නම් ලද ඇවැන්තයා වරෙක සාම්පූර් ප්‍රදේශයේ කිලෝමීටර් පහක් මුහුදේ පිහිනා ගොස් සිටියදී නාවික හමුදාව මඟින් බේරාගැනුණ පුවත එකල විශාල ප්‍රසිද්ධියක් ලැබීය. එහෙත් 2010 නොවැම්බර් මාසයේදී පමණ බ්‍රිගේඩියර්ගේ මළ සිරුර ජයන්තිපුර ප්‍රදේශයකින් හමුවේ. ඉතා අස්වාභාවික ලෙස හිස ඉහළට ඔසවාගෙන මියගොස් සිටි බ්‍රිගේඩියර්ගේ මරණය අදටත් අබිරහසකි.

හම්බන්තොට ගොන්නොරුව පාරේ කසළ වළ අසල සිටි වන අලි අටදෙනකුගෙන් එක් සතෙකි. 2004 සුනාමි ව්‍යසනයෙන් පසුව මේ ප්‍රදේශයේ ගම්මානයක් ඉදිවීම නිසා මේ අලි 8 දෙනාම පරිස්ථාපනය කරන ලද අතර මුලින්ම යාල කලාප අංක 02ට පිටමං කළ හෝමි දින 04ක් ඇතුළත යළිත් කසළ වළ වෙතට පැමිණියේය. දෙවැනුව උඩවලව ජාතික උද්‍යානය වෙත පරිස්ථාපනය කළ ද පෙර පරිදිම තම පාරම්පරික වාසභූමිය වෙත පැමිණි හෝමි අවසන් වශයෙන් මාදුරුඔය ජාතික උද්‍යානය වෙත ගෙන ගොස් දැමිණි. වෙඩි පහරවල් සියයකට පමණ ගොදුරු වූ හෝමි ඉතා අවාසනාවන්ත ලෙස මාදුරුඔය පොනාතිගල ප්‍රදේශයේදී මරණයට පත් විය. හම්බන්තොට කුණු වළේ දී කිසිදු මනුෂ්‍ය ඝාතනයක් සිදු නොකළ හෝමි මිය යන විට මිනිසුන් හතර දෙනකුගේ මරණයට චෝදනා ලබ සිටියේය.

HONDA
HET